**වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය - 2019**

---------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත, 1971 අංක 38 දරන මුදල් පනත සහ 2018 අංක 32 දරන වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිළිබඳ පනතේ 22 වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.
මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව දේපළ, පිරියත හා උපකරණ සඳහා කිසිදු වටිනාකමක් සඳහන් කර නොතිබුණ ද රේඛීය අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත ලබා දී තිබූ වත්කම් වර්ග 16ක වටිනාකම ආගණනය කොට ශ්‍රී.ල.ගි.ප්‍ර.අංක 16 පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය මගින් ලබා ගෙන ඇති වත්කම් ආගණනය කර ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරමි. එමෙන්ම අධිකාරිය විසින් වැඩි වශයෙන් භාවිතා කරනුයේ අමාත්‍යාංශයෙන් ලබා ගත් කාර්යාල උපකරණ බැවින් අමාත්‍යාංශය අනුගමනය කරන ගිණුම්කරන ප්‍රතිපත්තිය මෙන් වත්කම් ක්ෂය නොකර පිරිවැය මත ගිණුම්ගත කිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. | අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙත ලබා දී තිබූ වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී ජල සම්පාදන හා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙනුවෙන් වියදම් දරා තිබුණු අතර එයින් වැටුප් හා අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ගෙවීම වෙනුවෙන් දැරූ රු.498,000 ක මුදලක් තවදුරටත් නොපියවා තිබුණි. | ගෙවිය යුතු මුදලක් ලෙස සටහන් වීම වැරදි බව පිළිගනිමි | අමාත්‍යාංශය විසින් අධිකාරිය වෙනුවෙන් දැරූ වියදම් නිරවුල් කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීතිරීති/විධානයට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ------------------------ | | | |
| (අ) අංක පීඊඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |

| | | | | |
|---|---|---|---|---|
| | (i) 6.5.1 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 1,305 ක් ප්‍රමාද වී 2023 සැප්තැම්බර් 27 වන දින දීය. | කාර්ය මණ්ඩලය නොමැති වීම මත අදාල වර්ෂයේ එකි කාර්යය නියමිත පරිදි ඉටු කිරීමට හැකියාවක් ලැබී නොමැත. | ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| | (ii) 4.2.6 වගන්තිය | 2019 වර්ෂය වෙනුවෙන් කාර්යසාධන වාර්තා/ ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | කාර්ය මණ්ඩලය නොමැති වීම මත අදාල වර්ෂයේ එකි කාර්යය නියමිත පරිදි ඉටු කිරීමට හැකියාවක් ලැබී නොමැත. | කාර්යසාධන වාර්තා/ ප්‍රගති වාර්තා ඉදිරිපත් කළ යුතුය |
| | (iii) 5.1.3 වගන්තිය | 2020 - 2024 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | කාර්ය මණ්ඩලය නොමැති වීම මත අදාල වර්ෂයේ එකි කාර්යය නියමිත පරිදි ඉටු කිරීමට හැකියාවක් ලැබී නොමැත. | 2020 – 2024 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කළ යුතුය |
| (ආ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| | 4 වගන්තිය | පහත සඳහන් කරුණු ඇතුළත් වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.<br>- අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර<br>- අදාල වර්ෂය සඳහා අයවැය ලේඛනය<br>- අදාල වර්ෂය තුල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ ප්‍රතිඵල<br>- ප්‍රධාන ප්‍රසම්පාදනයන් සඳහා වන ප්‍රසම්පාදන | 2019 වර්ෂයේදි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, ගණකාධිකාරි (වැ.බ) හා පරිපාලන නිළධාරි(වැ.බ) පමණක් සේවය කර ඇත.එමෙන්ම ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් මූලධන වියදම් සඳහා වූ වැය විෂයක් නොමැති අතර සංවර්ධන වියදම් සඳහාද වැය විෂයක් නොමැත. | ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් විය යුතු අංගයන් ඇතුළත් කොට නිවැරදිව සකස් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සැලැස්ම<br>- භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ව්‍යවසායන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම<br>- අභ්‍යන්තර විගණන සැලැස්ම | | |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | 4.2.1 ඡේදය | අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | 2019 වර්ෂයේදි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, ගණකාධිකාරි (වැ.බ) හා පරිපාලන නිළධාරි(වැ.බ) පමණක් සේවය කර ඇත.එමෙන්ම ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් මූලධන වියදම් සඳහා වූ වැය විෂයක් නොමැති අතර සංවර්ධන වියදම් සඳහාද වැය විෂයක් නොමැත. | අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය |
| (ඈ) | 2019 අගොස්තු මස 22 දිනැති රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක MHNVICD/01/02/03 දරන ලිපිය | සමාලෝචිත වර්ෂය තුලදී මාස 06 ක් සඳහා වැටුප් ලෙස රු. 82,824 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | මේ පිළිබඳව තව දුරටත් කරුණු විමසා, ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | වැඩියෙන් ගෙවා තිබුණු වැටුප් නැවත අය කර ගැනිමට කටයුතු කළ යුතුය |

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ප්‍රාදේශීය අධ්‍යක්ෂ තනතුරක් සඳහා පූර්ණකාලීනව අයෙකු බඳවා නොගෙන ජල සම්පාදන හා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ මානව සංවර්ධන භාරයේ සේවය කරමින් සිටින නිලධාරියෙක් වසරකට රු. 240,000 ක මුදලක් ගෙවීමේ පදනම මත බඳවාගෙන තිබුණි. | 2019.06.03 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 5.2 අනුව) වැඩ පැවරුම් පදනම මත බඳවාගෙන ඇත | අනුමත තනතුරු සඳහා පූර්ණකාලීනව නිලධාරීන් බඳවා ගත යුතුය. |

## 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී රු. 2,498,060 ක වියදම් දරා තිබුණු අතර එයින් සියයට 80.24 ක් අධිකාරියේ වැටුප් හා දීමනා ගෙවීම වෙනුවෙන් ද සියයට 19.42 ක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙනුවෙන් වැය කර තිබුණ ද, අධිකාරියේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම වෙනුවෙන් හෝ ආයතනයේ විෂයපථය තුලට ගැනෙන කිසිදු කාර්යයක් හෝ ඉටු කිරීමට අදාළව වියදම් කර නොතිබුණි. | ආයතනයක් ස්ථාපනය කළ අවස්ථාවේ සිටම මෙහෙයුම් කටයුතු ආරම්භ කර පවත්වාගෙන යාමට ඇති හැකියාව අවම මට්ටමක පවති. ඒ සඳහා අවශ්‍ය තීරණ ගැනීමට හා ප්‍රතිපත්ති සම්පාදනයට යම් කාලයක් ගත වන අතර එම කටයුතු මෙහෙයවීම සඳහා නිලධාරීන්ට හා තීරණ ගැනීමේ කටයුතු වෙනුවෙන් පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙනුවෙන් මුදල් ගෙවිය යුතු අතර එම ගෙවීම් අදාල චක්‍රලේඛ අනුව,අනුමත සීමාවන්ට යටත්ව සිදුකර ඇත. | අධිකාරියේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම වෙනුවෙන් වියදම් ඵලදායි ලෙස දැරිය යුතුය. |